තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

INFORMATION AND COMMUNICATION TECHNOLOGY

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයුම් ක්‍රියාකාරකම්

PRE ENGAGEMENT & POST EVALUATION ACTIVITIES

GRADE 9

A Collaborative project of

ICT SCHOOL TEACHERS FACEBOOK GROUP

Compiled By: Janaka Pushpakumara

- නිපුණතාවය 1 :- පරිගණක සහ පර්යන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කරයි.
- නිපුණතා මට්ටම 1.1 :- පරිශීලක අවශ්‍යතාව මත පරිගණක සහ ඒවායේ පර්යන්ත උපාංග හඳුනා ගනියි .

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)

1) විවිධ පරිගණක වර්ග වල රූප සටහන් රැගෙන එන්න.
2) පරිගණක ක්ෂේත්‍රය හා සම්බන්ධ රැකියා අවස්ථා වැඩිහිටියන්ගෙන් අසා ලැයිස්තුවක් සකස් කර රැගෙන එන්න.

✓ ***Tips for teachers***

1) *සිසුන් රැගෙන එන පරිගණක වර්ග වල රූප සටහන් උපයෝගී කර ගනිමින් එහි කාර්යයන්, පහසුකම් හා එම කාර්යය අනුව රැකියා අවස්ථාවද හඳුන්වා දෙන්න.*

පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)

පෙළපොතෙහි පිටු අංක 4 හි සඳහන් 1.2 රූපයට අනුව පරිගණක වර්ග අලවා එහි එක්න එකට අදාල වාසි හා අවාසි සඳහන් කර නිර්මාණයක් සකස් කරන්න.

✓ ***Tips for teachers***

1) *දරුවන් නිර්මාණය කරන රූප සටහන් කිහිපයක් තෝරා පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනයට උපදෙස් ලබා දෙන්න.*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

නිපුණතාවය 1
නිපුණතාවය 1.1

- **පූර්ව ඉගෙනුම් අවස්ථා**
    1. පරිගණක විකිණීම සඳහා ඇති පුවත්පත් හෝ සඟරා ආදියෙහි ඇති දැන්වීම් රැගෙන එන්න.

✓ *Tips for teachers*

- සැබවින් පරිගණයක් ඇල්ලීමටත් එහි පරියන්ත උපාංග පරීක්ෂා කිරිමට අවස්ථාව දෙන්න.
- දෘඪාංග පුවරුව පරීක්ෂා කර එහි ඇති පර්යන්ත උපාංග හඳුනාගැනීමට අවස්ථාව දෙන්න.
- ඒවායේ නම් දැන්වීමක් සමඟ සසඳමින් පවසන්න.

- **පසු ඇගයීම් ක්‍රියාකාරකම්**
    1. පරිගණකයක ඇති පර්යන්ත උපාංග යනු මොනවාද?වර්ග කර ලියන්න.(අභ්‍යාස පොතට)
    2. බිත්ති පුවත්පත පර්යන්ත උපාංග නම් කරමින් රූපයක් අඳින්න.

✓ *Tips for teachers*

- දෘඪාංග පුවරුව පරීක්ෂා කර එහි ඇති පර්යන්ත උපාංග වෙ වෙනම වර්ග කර පැවසිය හැකිදැයි පරීක්ෂා කරන්න.

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

නිපුණතාවය 1
නිපුණතාවය 1.2

- **පූර්ව ඉගෙනුම් අවස්ථා**
  1. පරිගණක විකිණීම සඳහා ඇති පුවත්පත් හෝ සඟරා ආදියෙහි ඇති දැන්වීම් රැගෙන එන්න.
  2. තමාගේ දැන්වීම හා අනෙක් යහළුවන්ගේ දැන්වීම් සසඳන්න.

✓ Tips for teachers

- ඒවායෙහි ඇති කරුණු හා පරිගණකයක ඇති කොටස් සැබවින් සන්සන්දනය කර පැහැදිලි කරන්න.

- **පසු ඇගයිම් ක්‍රියාකාරකම්**
  1. පරිගණක හා පර්යන්ත උපාංග වල පිරිවිතර ලියන්න.
  2. ඔබගේ දැන්වීමට අනුව තාක්ෂණික පිරිවිතර හඳුනාගෙන ලියන්න.

✓ Tips for teachers

- දැන්වීම අභ්‍යාස පොතේ අලවන්න.
- කණ්ඩායමක් ලෙස පරිගණකයක් විකිණීම සඳහා පිරිවිතරයක් සකසන්න.ඒවායින් හොඳම පිරිවිතරය තේරීමට සිසුනට අවස්ථාව දෙන්න.

ictnotes.org

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 1 :- පරිගණක සහ පයීන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කරයි.
- නිපුණතා මට්ටම 1.2 :- පරිශීලක අවශ්‍යතාව පරිගණකයකට සහ පයීන්ත උපාංග බවට පත් කරයි.

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1) ඔබගේ නිවසට විදුලි උපකරණයක් (උදා - රූපවාහිනි, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර) මිල දී ගැනීමේදී සැලකිලිමත් වන කරුණු පිලිබඳ ව වැඩිහිටියෙකුගෙන් විමසා ගෙන පැමිණෙන්න.
2) ඔබ නිවසේ ඇති ශීතකරණය සහ මාලු වෙළඳසැලක ඇති ශීතකරණ,සුපිරි වෙළඳසැලක ඇති ශීතකරණ අතර වෙනස වැඩිහිටියෙකු සමඟ සාකච්ඡා කරන්න.

✓ ***Tips for teachers***

1. *දරුවන් විසින් සොයාගෙන එන විදුලි උපකරණ සම්බන්ධ තොරතුරු සමඟ සංසන්දනය කරමින් පරිගණකයක් මිල දී ගැනීමේදී සැලකිලිමත් විය යුතු පිරිවිතර විස්තර කරන්න.*
2. *ශීතකරණ සම්බන්ධ උදාහරණය ඇසුරින් පරිශීලක අවශ්‍යතා අනුව පරිගණකයේ පිරිවිතර වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.*

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

1) පරිගණක කාමරයේ ඇති පරිගණක වල මූලික පිරිවිතර පරීක්ෂා කර සටහන් කිරීමට දරුවාට උපදෙස් දෙන්න.
2) පරිගණකයක් මිල දී ගැනීමේදී අවශ්‍ය පිරිවිතර නොදැන සිටීමෙන් ඇති වන අවාසි සඳහන් කරන්න.

✓ ***Tips for teachers***

1. *දරුවන්ගේ පිළිතුරු නිවැරදි කරන්න.*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 1 :- පරිගණක සහ පර්යන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කරයි.
- නිපුණතා මට්ටම 1.3 :- පරිගණකයේ පර්යන්ත උපාංග හඳුනා ගැනීම හා එහි මූලික පිරිවිතර හඳුනා ගනියි.

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

3) පරිගණකයක තිබිය යුතු සියළු කොටස් (බාහිර හා අභ්‍යන්තර) දැක්වෙන රූප සටහන් එකතුවක් සකස් කර රැගෙන එන්න.
4) එම එක් එක් කොටසෙහි විස්තර දැක්වෙන පත්තර ලිපි හෝ අදාල විස්තර දැක්වෙන වෙනත් ලිපි රැගෙන එන්න.
5) පරිගණක අලවිය හා මිලදී ගැනීම් පිළිබඳව පුවත්පත් වල පළ කර ඇති විවිධ ප්‍රචාරණ දැන්වීම් එකතුවක් සකසා රැගෙන එන්න.

✓ ***Tips for teachers***

2) දරුවා රැගෙන එන පරිගණකයේ කොටස් හඳුන්වා දෙමින් එම එක් එක් තොටස් වල පිරිවිතර පිළිබඳව සිසුන්ට හඳුන්වා දෙන්න.

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

- පරිගණකයේ එක් එක් කොටසෙහි රූපය
- එයට අදාළ පිරිවිතර ලියා
- පරිගණකයක් මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු ද ඇතුළත් කර පොත් පිංචක් සකස් කරන්න.

✓ ***Tips for teachers***

ictnotes.org

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණය සඳහා පැතුරුම්පත් මෘදුකාංගය භාවිත කරයි
- නිපුණතා මට්ටම 2.1 :- පැතුරුම්පත් මෘදුකාංග වල මූලිකාංග විස්තර කරයි

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1) සරල ගණනක් කොටු රුල් කොලයක නිවසේදී සෑදීමට පෙර දිනයේදී ලබාදීම.
2) එම ගණනම එක්සෙල් වැඩ පතක විසඳා save කර ගැනීම.
3) පන්තියේ සිසුන් පස් දෙනෙකු ගේ පමණ (කාලය අනුව 10 පමණ නම් යොදා ගත හැකි නම් වඩා හොඳයි) නම් යොදාගෙන සකස් කරන ලද වාර විභාග ලකුණු විශ්ලේෂණය කළ හැකි සිසුවාගේ ස්ථානය ඉබේ සැකසෙන වැඩ පතක් සකසා ගැනීම

✓ ***Tips for teachers***

1) ගණන් පොත හා පරිගණකයෙන් සකසන ලද වැඩ පත සංසන්දනය කරමින් අතුරුමුහුණත පිළිබඳව අවබෝධයක් ලබා දීම.
කොටු රුල් පොත = වැඩපොත
කොටුරුල් පිටුව = වැඩපත
ගණන් පොතේ තීරු = වැඩ පතේ තීරු
ගණන් පොතේ පේළි = වැඩ පතේ පේළි
ගණන් පොතේ කොටු = කෝෂ.

2) සිසුන් රැගෙන එන කොටුරුල් කොළය භාවිතා කර එහි තීරු ඉංග්‍රීසි අකුරු වලින් ද පේළි ඉලක්කම් වලින් ද නම් කිරීමට පැවසීම හා ඒ ඇසුරින් කෝෂ ලිපින සාදන ආකාරය පහදා දීම

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

පන්තියේ සිසුන්ගේ නම් යොදාගෙන සකස් කරන ලද වැඩ පතට සිසුන්ට දත්ත ඇතුලත් කිරීමට අවස්ථාව ලබා දීම හා ඔවුන්ගේ ස්ථානය සැකසෙන ආකාරය නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දීම

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණ සඳහා පැතුරුම් පත් මෘදුකාංගය භාවිතා කරයි.
- නිපුණතා මට්ටම 2.1 :- පැතුරුම් පත් මෘදුකාංග වල මූලිකාංග විස්තර කරයි..

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

6) මුල් යුගයේ ගණන් සෑදීමේ ක්‍රම ශිල්ප පිළිබඳ තොරතුරු රැගෙන එන්න.
7) පැතුරුම් පත් මෘදුකාංගයේ මෙවලම් හොඳින් අධ්‍යනය කර පැමිණෙන්න.

✓ ***Tips for teachers***

3) දරුවන් විසින් ගෙනෙන ලද මුල් යුගයේ ගණන් සෑදීමේ ක්‍රම පිළිබඳ විස්තර කරමින් වර්ථමානයේ භාවිතා කරන මෘදුකාංගද විස්තර කරන්න
4) පැතුරුම් පත් මෘදුකාංගය සතු මෙවලම් එකින් එක සිසුන් සමග සාකාච්ඡා කරන්න.

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>



මෙම ආකාරයට පැතුරුම්පත් මෘදුකාංග අතුරු මුහුණතක් නිර්මාණය කරන්න. කොටස් ද නම් කරන්න.

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණය සඳහා පැතුරුම්පත් මෘදුකාංගය භාවිත කරයි
- නිපුණතා මට්ටම 2.2 :- වැඩ පතකට දත්ත ඇතුළත් කරයි

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1) පන්තියේ සිසුන්ගේ නම් යොදාගෙන සකස් කරන ලද වාර විභාග ලකුණු විශ්ලේෂණය කළ වැඩ පතක් සකසාගෙන 2.2 නිපුණතා මට්ටමට අවශ්‍ය පරිදි හැඩ සවිකිරිම. (කෝෂ හැඩසවි කිරීමේ මේවලම් කිහිපයක්
එකෙල්ල කිරීම හා ස්ථානගත කිරීමේ මෙවලම් කිහිපයක්
Number formatting tools කිහිපයක්)
2) ඉහත සකසන ලද වැඩ පතේ වර්ණ මුද්‍රිත පිටපත් කීපයක් ලබා ගැනීම

✓ ***Tips for teachers***

1) මුද්‍රිත පිටපත් සිසුන්ට ලබා දී පෙර දැනුම භාවිතයෙන් සිදු කර ඇති හැඩසවි කිරීම් විමසා සිටීම.
2) පැතුරුම්පත් මෘදුකාංගවල පවතින විශේෂිත වූ හැඩ සවි කිරීම් මුද්‍රිත පිටපත ඇසුරින් පෙන්වා දීම

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

හැඩසවි නොකරන ලද දත්ත වගුවක් ලබාදී දෙන ලද හැඩසවි කිරීම්සිදු කිරීමට උපදෙස් ලබාදීම

✓ ***Tips for teachers***

1. මුදල් ඒකක සඳහා currency දත්ත වර්ගය භාවිත කර රුපියල් සඳහාවූ ඒකකය ඇතුලත් කරන අයුරු පහදා දීම

ictnotes.org

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණය සඳහා මෘදුකාංග භාවිත කරයි.
- නිපුණතා මට්ටම 2.2 :- වැඩපතකට දත්ත ඇතුලත් කරයි.

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

8) පුවත්පත් , සඟරා ආදියෙහි ඇති වගු වල එකතුවක් සකසා රැගෙනඑන්න.
9) එම වගුවල ඇති වෙනස්කම් හඳුනා ගන්න. තීරු පළල, පේළි උස, අකුරු වර්ගය, අකුරු වල ප්‍රමාණය, යොදා ඇති බෝඩරය පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න.

✓ ***Tips for teachers***

5) දරුවන් රැගෙන එන වගු සහිත පුවත්පත් කොටස් වල ඇති වෙනස් කම් පිළිබඳව උදාහරණ පෙන්වමින් දරුවන්ට පැහැදිලි කරන්න.
6) විවිධ කාර්යයන් අනුව, අවශ්‍යතාවය අනුව විවිධ හැඩසව් ගැන්වීම් සිදු කිරීමේ අවශ්‍යතාවය සිසුන්ට පැහැදිලි කරන්න. ඒ සමඟම ඉහත හැඩසව් ගැන්වීම් ඉතා පහසුවෙන් පැහැදිලිව අලංකාරව සිදු කිරීමට

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

පංතියට රැගෙන ආ වගු උදාහරණයට ගනිමින් අලංකාර වගුවක් විවිධ හැඩසව්ගැන්වීම් භාවිතයෙන් නිර්මාණය කරන්න .

✓ ***Tips for teachers***

2) දරුවන්ගේ නිර්මාණ අතරින් හොඳම නිර්මාණ තුන පරිගණක විද්‍යාගාරයේ බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරනු ලබන බවට උපදෙස් ලබා දෙන්න.

ictnotes.org

ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity book ICT Activity

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණය සඳහා මෘදුකාංග භාවිත කරයි.
- නිපුණතා මට්ටම 2.2 :- වැඩපතකට දත්ත ඇතුලත් කරයි.

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1) නිවසේ දී වැදගත් ලේඛනගබඩා කරනු ලබන ආකාරය පිළිබඳ ව වැඩිහිටියන්ගෙන් අසා දැනගන්න.
2) එම ක්‍රමවේද ලැයිස්තුවක් සකසා ගෙන පැමිණෙන්න.
3) පෙර දිනයේරැගෙන පැමිණි වගුවල සංඛ්‍යාත්මක දත්ත ඇති තීරු පිළිබඳ අවධානය යොමු කර එකිනෙකට වෙනස් සංඛ්‍යාත්මක දත්ත ආකාර සටහන් කර ගෙන පැමිණෙන්න.

✓ ***Tips for teachers***

1) *Number,Text,Currency,Date & Time ආදී දත්ත ප්‍රරූප පිළිබඳව දරුවන් රැගෙන එන කරුණු හා සම්බන්ධ කරමින් සාකච්ඡා කරන්න.*
2) *නිවසේ දී, කාර්යාල වලදී ආදී ස්ථාන වල වැදගත් තොරතුරු නැවත භාවිතා කිරීම සඳහා ගබඩා කර ගනු ලබන ආකාරය පිළිබඳව සිසුන් රැගෙන එන ලැයිස්තු භාවිතා කරමින් සාකච්ඡා කරන්න.*
3) *එලෙසම පරිගණකය භාවිතා කිරීමේ දී ද නැවත ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩා කිරීම අවශ්‍ය බව පැහැදිලි කරන්න . එය පරිගණකය භාවිතයේ දීSave කිරීම ලෙස හඳුන්වන බවත් එය සිදු කරනු ලබන ආකාරයත් පැහැදිලි කරන්න.*

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

- දත්ත ප්‍රරූප සඳහා උදාහරණ සහිත නිර්මාණයක් සකසන්න.

✓ ***Tips for teachers***

1) *දත්ත ප්‍රරූප සඳහා උදාහරණ ලබා දෙන්න. ඒවා භාවිත කරමින් නිර්මාණය කිරීමට උපදෙස් ලබා දෙන්න.*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 2 :- ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණය සඳහා මෘදුකාංග භාවිත කරයි.
- නිපුණතා මට්ටම 2.3 :- සරල ගණිතමය ගණනය කිරීම් ක්‍රියාවේ යොදවයි.
-

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1) පෙර දිනයේ ගුරුවරයා ලබා දුන් ගණිත ගැටළු විසඳීමට උත්සහ කරන්න.
2) එම පිළිතුරු විසඳීමේ පියවර සමඟ පැහැදිලිව සටහන් කරන්න.

✓ ***Tips for teachers***

1) *ළමුන් කිහිපදෙනෙකුට ලබා දුන් ගැටළු කළුලැල්ලේ විසඳීමට අවස්ථාව ලබා දෙන්න.*
2) *එම පිළිතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව මෙහෙයවන අනුපිළිවෙළ සලකමින් පැහැදිලි කරන්න.*
3) *පැතුරුම්පත් මෘදුකාංග වලදී ගණිත කර්ම භාවිතා කරන ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරමින් පැහැදිලි කරන්න.*
4) *එහිදී කෝෂ ලිපින භාවිතා කරන ආකාරය උදාහරණ මඟින් පැහැදිලි කරන්න*

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

වැඩ පොතෙහි පිටු 16 හි ඇති ABC Network Solutions වගුව පිටපත් කර ගෙන එහි ඇති Balance, Total, No of packs, Grand Total යන තීරු වල අගයන් ලබා ගැනීමට ලිවිය යුතු සමීකරණ කෝෂ ලිපින භාවිතා කරමින් ලියන්න.

✓ ***Tips for teachers***

1) *නිවැරදි නිර්මාණ තෝරා පාසල් බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරනු ලබන බවත් අනෙකුත් නිර්මාණ නිවසේ පාඩම් කරන මේසය අසල නිර්මාණය කරනු ලබන බිත්ති පුවත්පතක සටහන් කිරීමට උපදෙස් ලබා දෙන්න.*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 3 :- අනුක්‍රමය , තෝරා ගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම සඳහා ගැලීම් සටහන් භාවිත කරයි.(Scratch භාවිතය)
- නිපුණතා මට්ටම 3.2 :- දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යුහ භාවිත කරයි.
- පළමු කාලච්ඡේදය :- බහු කොන්දේසි සහිත තේරීම් පාලන ව්‍යුහ

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

10) නිවසේ දී මව හෝ වැඩිහිටි පුද්ගලයෙකු ව්‍යංජනයක් සකස් කරන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න. එහිදී ව්‍යංජනය රසවත් කර ගැනීමට ලුණු ,ඇඹුල්, තුනපහ , මිරිස් ආදිය යොදන ආකාරය ඔවුන්ගෙන් විමසන්න

✓ ***Tips for teachers***

7) අහඹු ලෙස දරුවෙකුගෙන් විමසා නිවසේ දී සාදන ලද එක් ව්‍යංජනයක් ගන්න. එය රසවත් කිරීමට පදමට ලුණු , ඇඹුල් මිරිස් , තුනපහ ආදිය යොදන ආකාරය දරුවන් සමඟ සාකච්ඡා කරන්න. මෙහි දී ව්‍යංජනය පිසින අතරතුර දී ලුණු ඇඹුල් බලමින් නැවත එක් වරක් පමණක් මෙම ද්‍රව්‍ය යොදා රසවත් කරන බව පවසමින් ඒ ඇසුරෙන් කොන්දේසි කිහිපයක් සහිත ගැලීම් සටහනක් නිර්මාණය කර බහු කොන්දේසි යන්න පහදා දෙන්න .

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

එදිනෙදා ජීවිතයේ දී ඔබට හමුවන බහු කොන්දේසි සහිත තේරීම් පාලන ව්‍යුහයකට අදාල ගැලීම් සටහනක් නිර්මාණය කරන්න.

✓ ***Tips for teachers***

3) දරුවන් නිර්මාණය කරන ගැලීම් සටහන් කිහිපයක් තෝරා පාසලේ දැන්වීම් පුවරුවට ද සෙසු නිර්මාණ නිවසේ ද ප්‍රදර්ශණයට උපදෙස් ලබා දෙන්න.

ictnotes.org

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 3 :- අනුක්‍රමය , තෝරා ගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම සඳහා ගැලීම් සටහන් භාවිත කරයි.(Scratch භාවිතය)
- නිපුණතා මට්ටම 3.2 :- දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යුහ භාවිත කරයි.
- දෙවන කාලච්ඡේදය :- සරල පුනර්කරණ සහිත පාලන ව්‍යුහ

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)

1) ශීතකරණය, විදුලි පෝරණුව(Oven) , විදුලි ස්ත්‍රික්කය ආදියේ ක්‍රියාකාරිත්ව හොඳින් නිරීක්ෂණය කර ඒ පිළිබඳව වැඩිහිටි පුද්ගලයෙකු සමඟ සාකච්ඡා කර පැමිණෙන්න

✓ ***Tips for teachers***

ශීතකරණයේ, විදුලි පෝරණුවේ හෝ විදුලි ස්ත්‍රික්කයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විමසමින් සිසුන් සමඟ සාකච්ඡාවක් ගොඩනගන්න .

1. *ශීතකරණයේ උෂ්ණත්ව සංවේදකයෙහි සඳහන් උෂ්ණත්වයට වඩා උෂ්ණත්වය ඉහළ ගිය අවස්ථාවක සිසිලන චක්‍රය ආරම්භවන බවත් එහි දී ශීතකරණයේ සිසිලන පද්ධතියේ ඇති සිසිල් ජලය මෙම උෂෘණත්වය උරා ගනිමින් එම උෂ්ණත්වය පිටත පිහිටි දඟරය හරහා පිටකරන බවත් මෙය නැවත නැවත සිදු වන ක්‍රියාවලියක් බව පහදන්න.*
2. *විදුලි පොරණුවේ දී තබන උෂ්ණත්වය හා වේලාව අනුව මෙය ක්‍රියාත්මක වන බව ද, මෙහි ඇති දඟරය උපරිම උෂ්ණත්වයට රත් වූ පසු ක්‍රියාකාරිත්වය නතර වී සිසිල් වන බවද නැවත සාමාන්‍ය උෂ්ණතවයට පත් වූ පසු ක්‍රියාරිත්වය ආරම්භ වී නැවත උපරිම උෂ්ණත්වයට පත්වෙන බවද මෙය නැවත නැවත කාලය අවසන් වන තෙක් ක්‍රියාකරන බව පෙන්වා දෙන්න*
3. *විදුලි ස්ත්‍රික්කයේ ක්‍රියාකරන අකාරය මේ ආකාරයටම සිදුවන බව සිසුවෙකුගේ අදහස් මඟින් ලබා ගන්න.*

නැවත නැවත සිදුවීම පුනර්කරණය ලෙස හඳුන්වන බව පෙන්වා දෙන්න.

පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)

තේරීමක හා පුනර්කරණයේ ඇති වෙනස්කම් ලියන්න

✓ ***Tips for teachers***

1) *දරුවන්ගේ පිළිතුරු නිවැරැදි කරන්න*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 3 :- අනුක්‍රමය , තෝරා ගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම සඳහා ගැලීම් සටහන් භාවිත කරයි.(Scratch භාවිතය)
- නිපුණතා මට්ටම 3.2 :- දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යුහ භාවිත කරයි.
- තෙවන කාලච්ඡේදය :- දෘශ්‍ය ආධාරක සහිත ක්‍රමලේඛ භාෂා අතුරු මුහුණත් භාවිතයෙන් ක්‍රමලේඛ සංවර්ධනය කිරීම (Repeat පුනර්කරණය)

<u>**පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)**</u>

ගුණන වගුව හොඳින් නිරීක්ෂණය කර පහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න

1. තත්පර 10 ක් ඇතුලත 6 හි පළමු ගුණාකාර 12 කොළයක සටහන් කිරීමට උත්සාහ කරන්න .
2. තත්පර 10 ක් ඇතුලත 9 හි පළමු ගුණාකර 12 කොළයක සටහන් කරන්න
3. ඔබට කැමති සංඛ්‍යාවක් සිතා එම සංඛ්‍යාවේ පළමු ගුණාකාර 12 තත්පර 10 ඇතුලත සටහන් කරන්න.

✓ ***Tips for teachers***

1) *තත්පර 10 ක් ඇතුළත පිළිතුරු ලියූ දරුවන් කවුරුන් දැයි විමසන්න. තත්.10 ක් තුළ මෙය සිදුකිරීමට අපහසු බවත් ඒ සඳහා ඊට වඩා වැඩි කාලයක් මිනිසාට ගත වන බව පෙන්වා දෙන්න. එහෙත් පරිගණකය මඟින් ඉතා කෙටි කාලයක් තුළ මෙවැනි වැඩසටහන් නිර්මාණය කල හැකි බව පෙන්වා දෙන්න.*
2) *මෙහි ගුණාකාර 12 ක් එනම් නිශ්චිත වාර 12 ක දී සිදුකරන බවත් , එනම් නිශ්චිත වාර ගණනකදී සිදු කරන ක්‍රියා සඳහා Repeat යන්න භාවිතා කරන බව පවසමින් පාඩමට පිවිසෙන්න.*

<u>**පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)**</u>

පියවර 2 බැගින් 50 වාරයක් ඉදිරියට පුනර්කරණය වන වැඩසටහනක් නිර්මාණය කරන්න

✓ ***Tips for teachers***

1. *ඔවුන්ට එම වැඩසටහන නිර්මාණය කිරීම සහන කාලච්ඡේදයක හෝ නිවසේ දී සිදුකරන ලෙස පවසන්න. එම නිර්මාණය කරන ලද වැඩසටහනෙහි නිවැරදි බව පරීක්ෂා කර ඔවුන් අගයන්න .*

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 3 :- අනුක්‍රමය , තෝරා ගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම සඳහා ගැලීම් සටහන් භාවිත කරයි.(Scratch භාවිතය)
- නිපුණතා මට්ටම 3.2 :- දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යුහ භාවිත කරයි.
- තෙවන කාලච්ඡේදය :- දෘශ්‍ය ආධාරක සහිත ක්‍රමලේඛ භාෂා අතුරු මුහුණත් භාවිතයෙන් ක්‍රමලේඛ සංවර්ධනය කිරීම (Repeat until පුනර්කරණය)

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1. ඔබ නිවසේ සිටින අවස්ථාවක ඔබගේ යහළුවන් කිහිපදෙනෙකු නිවසට පැමිණෙනවායැයි සිතන්න. එම මොහොතේ වැඩිහිටියෙකු නිවසේ නොසිටියේ නම් යහළුවන්ට සංග්‍රහ කිරීම ඔබට පැවරේ. මෙවැනි අවස්ථාවක තේ සෑදීම සිදුකරන ආකාරය පියවරයන් සටහන් කරගෙන එන්න
2. විදුලි බිල්පත් මනු කියවන්නෙකු සහ ලියුම් බෙදන්නෙකු ඔහුගේ රැකියාව සිදුකරන ආකාරය පිළිබඳව වැඩිහිටියෙකු සමඟ සාකච්ඡා කොට පැමිණෙන්න

✓ ***Tips for teachers***

1. *කිහිප දෙනෙකුට තේ පිළියෙල කිරීමේ දී එකවර එය රසවත් වීම සිදු නොවන බවත් මෙයට නැවත නැවත කිහිපවරක් සීනි දමමින් තේ එක රසවත් වන තුරු එනම් රසවත් තේ එක යන කොන්දේසිය තෘප්ත වනතුරු මෙම ක්‍රියාවලිය සිදුකරන බව පහදන්න .*
2. *විදුලි බිල්පත් මනු කියවනනෙකුට නිවාස කිහිපයක මනු කියවන්නට සිදුවන බවත් ඔහුට පැවරී ඇති නිවාස සියල්ල ඉවරවන තෙක් නිවාස සියල්ලටම යා යුතු බව , නිවාස සියල්ල අවසන් යන කොන්දේසිය තෘප්ත වන තුරු නිවාස සියල්ලට ගමන් කලයුතු බව පෙන්වා දෙන්න*
3. *ලියුම් බෙදෙන්නා සිදුකරන්නේ මෙවැනිම ක්‍රියාවක් බව සිසුන්ගේ පිළිතුරු මඟින් ලබා ගන්න*

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

ඔබ කැමති පසුබිමක් හා සත්ත්ව රූපයක් ඇසුරින් repeat until පාලකය යොදා ගනිමින් scratch මෘදුකාංගය ඇසුරින් නිර්මාණයක් කරන්න

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 3 :- අනුක්‍රමය , තෝරා ගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම සඳහා ගැලීම් සටහන් භාවිත කරයි.(Scratch භාවිතය)
- නිපුණතා මට්ටම 3.2 :- දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යුහ භාවිත කරයි.
- තෙවන කාලච්ඡේදය :- දෘශ්‍ය ආධාරක සහිත ක්‍රමලේඛ භාෂා අතුරු මුහුණත් භාවිතයෙන් ක්‍රමලේඛ සංවර්ධනය කිරීම (forever පුනර්කරණය)

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

1. ජල චක්‍රය , නයිට්‍රජන් චක්‍රය , ගසක වර්ධනය , ඉර පෑයීම සහ බැස යාම යන සිද්ධීන් සිදුවන ආකාරය පිළිබඳව වැඩිහිටි පුද්ගලයෙකු සමඟ සාකච්ඡා කර පැමිණෙන්න

✓ ***Tips for teachers***

1. *ජල චක්‍රය - මෙහිදී සිදුවන සිදුවීම සරලව පෙන්වා දෙන්න (පොළව මතුපිය ඇති ජලය සූර්යයාගේ උෂ්ණත්වයෙන් වාෂ්ප බවට පත්වී ඉහලට නැග වළාකුළු ලෙස ඝනීභවනය වී නැවත වර්ෂාව ලෙස ජලට පොළවට ලැබෙන බව)*
2. *නයිට්‍රජන් චක්‍රය, ගසක වර්ධනය, ඉර පෑයීම සහ බැසීම යන සිද්ධීන් පිළිබඳව දරුවන්ගෙන් විමසමින් මේ සිදුයීන් සියල්ල ද නැවත නැවත අඛණ්ඩව සිදුවන බව පෙන්වා දෙමින් මෙලෙස අඛණ්ඩව සිදුවන ක්‍රියා සඳහා වැඩසටහන් නිර්මාණයේ දී forever යන පාලකය භාවිත කරන බව හඳුන්වා දෙමින් පාඩමට පිවිසෙන්න.*

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

forever පාලකය භාවිතා කරමින් කැමති වැඩසටහනක් scratch මෘදුකාංගය හරහා නිර්මාණය කරන්න

✓ ***Tips for teachers***

ඔවුන්ට එම වැඩසටහන නිර්මාණය කිරීම සහන කාලච්ඡේදයක හෝ නිවසේ දී සිදුකරන ලෙස පවසන්න. එම නිර්මාණය කරන ලද වැඩසටහනෙහි නිවැරැදි බව පරීක්ෂා ක

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 5 :-සන්නිවේදනය සහ සම්පත් හවුලේ භාවිතය සඳහා පරිගණක ජාල විමර්ශනය කරයි.
- නිපුණතා මට්ටම 5.2 :-පාසල් පරිගණකගාරයේ පරිගණක ජාල වල ප්‍රධන සංරචක ගවේශනය කරයි

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

11) සමාජයේ පවතින ජාල පිළබඳව තොරතුරු දෙමාපියන් හෝ වැඩිහිටියන්ගෙන් දැන ගැනිම (මේ සඳහා සමාජ ජාල හෝ වෙනත් මිනිස් ක්‍රියා කාරී ජාල භාවිත කළ හැක
12) ඔබගේ නිවසේ හෝ යහළුවකුගේ නිවසේ අන්තර්ජාල පහසුකම ඇත්නම් ඒ සඳහා භාවිතා කර ඇති උපංග පිළිබඳ දැනුමක් ලබා ගැනීම තවත් දැනුම ලබා ගැනිම සඳහා අන්තර්ජාලය භාවිතා කිරිම
13) ඒම අන්තර්ජාල පහසුකම ලබා ගැනිම සඳහා පරිගණක සම්බන්ධ කර ඇති ආකාරය ගැන කරුනු ඒකතු කර ගැනීම

✓ ***Tips for teachers***

8) ළමුන් ජාල පිළබදව සොයා ගෙන ඇති තොරතුරු විමසා ඒම තොරතුරු මහින් පාඩමට පිවිසිම
9) පරිගණකගාරයේ ඇති පරිගණක ජාලයේ උපාංග ගැන විස්තර කර පෙන්වීම
10) Cisco Packet Tracer මෘදුකාංගය භාවිතා කර පරගණක ජාලයක් නිර්මාණය කර පෙන්විම හා එම උපකරණ සඳහා භාවිතා කරන සම්මත සංකේත පිළිබද දැනුම ලබා දීම
11) පරිගණක සම්බන්ධ කිරිමට භාවිතා කරන ක්‍රම ළමුන්ට කිය දීම
12) පරිගණක ජාල කරනයේ වාසි අවසි කිය දීම

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

ළමුන් කණ්ඩායම් ගත කර Cisco Packet Tracer මෘදුකාංගය භාවිතා කර පරිගණකගාරයට පරිගණක ජාලයක් නිර්මාණය කර වීම

ඉන් පසු එම කණ්ඩායම් එම පරිගණක ජාලය සැකසීමට ගත් උපාංග හා සම්බන්ධ කිරිම ගත් ක්‍රමයන් ගැන පන්තියේ අනෙකුත් ළමයින් දැනුවත් කිරිමට අවස්ථාව ලබා දීම

✓ ***Tips for teachers***

4) අන්තර්ජාලය භාවිතයෙන් පරිගණක ජාල උපාංග පිළිබද රූප සහ විඩියෝ ළමුන්ට වෙන්වීම
5) Cisco Packet Tracer මෘදුකාංග පිළිබදව ළමුන්ව දැනුවත් කිරිම

ictnotes.org

- නිපුණතාවය 5 :-සන්නිවේදනය සහ සම්පත් හවුලේ භාවිතය සඳහා පරිගණක ජාල විමර්ශනය කරයි.
- නිපුණතා මට්ටම 5.2 :-සන්නිවේදන සහ සම්පත් හවුලේ ප්‍රයෝජනයට ගැනිමට පසල් පරිගණක ජාලය ප්‍රයෝජනයට ගැනිම

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)

14) පරිගණක ජාලයක් භාවිතා කරමින් හවුලේ භාවිතා කර ගත හැකි සම්පත් පිළබඳව අන්තර්ජාලය භාවිතයෙන් හෝ වැඩිහිටියන් මගින් සොයාගෙන පැමිණිම
15) Cisco Packet Tracer මෘදුකාංගය භාවිතා කරමින් යහළුවන් සමඟ ඒකතු වෙමින් පරිගණක ජාලක් සකස් කිරිම

✓ ***Tips for teachers***

13) පරිගණක ජාල භාවිතා කරමින් සම්පත් හවුලේ භාවිතා කරිම පිළිබඳව ළමුන් සමඟ සකච්චා කිරිම දැනුම ලමුන් හා බෙදා ගැනිම
14) Cisco packet tracer මෘදුකාංගය භාවිතයෙන් පරිගණක ජාලයක් සකස් කරන ආකාරය සහ ඒ සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ග කියදෙන්න
15) පසලේ පරිගණක ජාලය භාවිතා කරමින් ළමුන්ට පරිගණක ජාලයක් තුල සම්පත් හවුලේ තබාගන්නා ආකරය පිළිබඳ ප්‍රයෝගික පුහුණුවක් ලබා දිම

පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)

ළමුන් කණ්ඩායම් ගත කර ඔවුනට පරිගණක ජාලය තුල සම්පත් හවුලේ තබා ගන්නා අයුරු පෙන්විම සඳහා ක්‍රියාකරකමක් සකසා ලබා දෙන්න

ඔවුන් එය සිදු කල ආකරය හා එහි දී ඔවුන්ට මතු වු ගැටළු ගැන විමසීම

✓ ***Tips for teachers***

6) ළමුන්ට පරිගණක ජාලයක සම්පත් හුවමාරු කිරිමේදි ඔවුන් පිළිබඳ විමසිල්ලෙන් සොයා බැලිම හා ඔවුන්ගේ ගැටළු වලට විසඳුම් ලබා දීම
7) අන්තර්ජලය භාවිතා කර සම්පත් හවුලේ තබා ගැනිම පිළිබඳ විඩියො පෙන්වී

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 6 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම සහ වෘත්තීය අවස්ථා ගවේෂණය කරයි.
- නිපුණතා මට්ටම 6.1 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම විස්තර කරයි.

<u>පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)</u>

16) දැනට අවුරුදු 10 කට පෙර පුද්ගලික රෝහලකින් බෙහෙත් ගැනීමට Chit එකක් වෙන් කර ගැනීමට සිදු කළ පියවර අස දැනගෙන එන්න
17) අවුරුදු ගණනාවකට පෙර දෙමව්පියන්ගේ විභාග ප්‍රතිඵල බලා ගත අයුරු අසා ගෙන එන්න
18) මේ කාලයේ විදුලි බිල් ගෙවීම, පිට රට අයෙකුට සල්ලි යැවීම ආදිය සිදු කරන අයුරු ගැන විස්තර සොයන් එන්න

✓ ***Tips for teachers***

16) සිසුන්ගේ පිළිතුරු අදියර 2ක් ඔස්සේ කතාබහ කරන්න. එහිදී එදා සහ අද ඉහත කී කාර්යයන් කිරීමේදී එහි ඇති වී ඇති වෙනස්කම් ඉස්මතු කරන්න.
17) රටේ සෑම ක්ෂේත්‍රයකම පාහේ ICT යොදාගෙන ඇති ආකාරය ඊ සෞඛ්‍ය,ඊ ඉගනුම, ඊ රාජ්‍ය , ඊ වෙළඳාම ඇසුරින් උදාහරණ ගෙන ගළපන්න.

<u>පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)</u>

අංකිත බෙදුම යනු කුමක්ද යන්න අධ්‍යනය කර ඒ නිසා සමාජයේ ඇති වී ඇති විෂමතාවයන් ගැන විස්තර සොයන්න.

ඊ ඉගනුම හා ඊ වෙළඳාමෙන් ලැබෙන වාසි සහ අවාසි මෙන්ම අපේ රටට ඒවායේ ඇති ගැළපීම පිළිබඳව articles සකසා ඒවායින් E-magazine එකක් නිර්මාණය කරන්න

✓ ***Tips for teachers***

8) දරුවන් ඉදිරිපත් කරන උදාහරණ පැහැදිලි කරන වීඩියෝ දර්ශන දරුවන්ට පෙන්වන්න.
9) *සිසු නිර්මාණ වලින්* E-magazine එක සෑදීමේදී ඔවුන් උනන්දු කරවීමට සිසුන් කණ්ඩායම් කර විවිධ මාතෘකා ලබා දීම

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 6 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම සහ වෘත්තීය අවස්ථා ගවේෂණය කරයි.
- නිපුණතා මට්ටම 6.1 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම විස්තර කරයි.

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)

3) ඔබ පාසලේදී ඉගෙනීම් කටයුතු වලදී, පාසලේ කාර්යාලයේදී සහ පුස්තකාලයේ දී පරිගණකය භාවිත කරන අවස්ථා යහළුවන් සමඟ සාකච්ඡා කරන්න.
4) රෝහලක භාවිත වන පරිගණක සහ පරිගණක හා සම්බන්ධ යන්ත්‍ර පිළිබඳ ව වැඩිහිටියෙකුගෙන් විමසා ගෙන පැමිණෙන්න.
5) ඔබේ නිවසේ කසළ (දිරන, නොදිරන) බැහැර කිරීමේදී අනුගමනය කරන දේවල් සටහන් කරන්න.

✓ ***Tips for teachers***

1. දරුවන් විසින් සොයාගෙන එන ලද අවස්ථා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමඟ සම්බන්ධ වන ආකාරය විස්තර කරන්න.
2. ඊට අමතරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ක්ෂේත්‍ර හඳුන්වා දෙන්න.
3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් එම ක්ෂේත්‍ර වලට ලැබුණු ප්‍රතිලාභ විස්තර කරන්න.
4. නිවසේ කසළ බැහැර කිරීමේදී අනුගමනය කරන උපායන්, පරිගණක ආශ්‍රිත විද්‍යුත් අපද්‍රව්‍ය ආරක්ෂිත ව බැහැර කිරීම සඳහා ප්‍රගමනය කරන අයුරු පෙන්වා දෙන්න. (3R Cycle)

පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)

1) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත වන ක්ෂේත්‍ර ලැයිස්තුගත කරන්න.
2) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වාසි සහ අවාසි වගු ගත කරන්න.

✓ ***Tips for teachers***

2. දරුවන්ගේ පිළිතුරු නිවැරදි කරන්න.

ictnotes.org

INFORMATION AND COMMUNICATION TECHNOLOGY
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

GRADE 9
9 ශ්‍රේණිය

Pre Engagement Activities and Post Evaluation Activities
පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් සහ පසු ඇගයීම් ක්‍රියාකාරකම්

- නිපුණතාවය 6 :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම සහ වෘත්තීය අවස්ථා ගවේෂණය කරයි.
- නිපුණතා මට්ටම 6.2 :- පරිගණක ආශ්‍රිත රැකියා විස්තර කරයි.

පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් (Pre Engagement Activities)

1) පරිගණක ආශ්‍රිත රැකියා පිළිබඳව පුවත්පත්වල පළ කර ඇති දැන්වීම් (රැකියා ඇබෑර්තු (එකතුවක් සකසා රැගෙන එන්න.

✓ ***Tips for teachers***

1. දරුවා රැගෙන එන රැකියා ඇබෑර්තු වල සඳහන් රැකියා අවස්ථා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
2. එක් එක් රැකියා අවස්ථා ආශ්‍රිත කායීයන් සහ පරිගණකයේ කුමන සංරචක හා සම්බන්ධ රැකියා අවස්ථාවන් ද යන්න පැහැදිලි කරන්න. (මෘදුකාංග, දෘඩාංග, පරිගණක ජාල, වෙබ් අඩවි ආදී වශයෙන්)

පසු ඇගයීම් ක්‍රියාකාරකම් (Post Evaluation Activities)

1) රැකියා අවස්ථාවන් සියල්ල ඉහත පැහැදිලි කල සංරචක වලට වර්ගීකරණය කර වගුවක් සකසන්න.

✓ ***Tips for teachers***

3. දරුවන්ගේ පිළිතුරු නිවැරදි කරන්න.

ictnotes.org